උපේක්ෂා සේනානායක ලියයි

# ප්‍රතිබිම්බ 7



උපේක්ෂා සේනානායක
ලියයි



අතුල උපසිරි කල්දෙමුල්ල ගේ
සිතුවමින්

## උඹ ඔතනින් නැගිටපං. නැත්තන් ඔය නංගි බස් එක හිල් කරයි

දුලිනිව මුලින්ම දැක්ක දවසෙ ඉඳන් සිද්ධ වුණ හැම පුංචි දෙයක්ම වගේ ආර්තී එක්ක කියන පුරුද්දක් මගේ තිබුණා. ඒ කාලෙ දුලිනිගෙ නම ඇරෙන්න කිසිම දෙයක් මං එයා ගැන දැනගෙන හිටියෙ නැහැ. ඒ කෙල්ලට තිබුණෙ පුදුම අහිංසක ඇස් දෙකක්. හරිම සරල විලාසිතා කීපයක් විතරයි එයා අනුගමනය කළේ. මට තාම මතකයි ලාරෝස පාට කලිසමක් එක්ක සුදු පසුබිමේ කළු බිංදු වැටුණු කුර්තා කමිසයක් ඇඳලා දිග කොන්ඩෙ තනි කරලට ගොතලා පුස්තකාලෙට යන පියගැට පෙළ නැග ගෙන එක දවසක් එයා ආපු හැටි. මාව දැකපු ගමන් බිමට නැඹුරු කරගත්තු හිස ආපහු එස වුණේ පුස්තකාල ගොඩ නැගිල්ල ඇතුලටත් ගියාට පස්සෙයි. මගේ හිතේ මං කාලයක් තිස්සෙ මවා ගෙන හිටපු රූපෙයි ගති ලක්ෂණයි සියල්ල පිහි-ටපු යුවතිය මගේ ඇස් ඉදිරියෙම ඉඳලත් මට මගේ හිතේ තිබුණ හැඟීම් කිසි දෙයක් එයාට කියාගන්න බැරි වුණේ ඇයි කියන ප්‍රශ්නෙ මං අදටත් මගෙන්ම අහනවා. ඒත් හැමදාම මට උත්තරයක් නැහැ.

දුලිනිව හැමදාම එයාගෙ තාත්තා හරි අයිය කෙනෙක් හරි ගෙනත් බස්සනවා. පසු කාලෙක මං දැන ගත්තා ඒ එයාගෙ එකම අක්කාගෙ මහත්තයා කියලා. නාත් වීරමන් කියලා කෙනෙක්. නාත් කොහොමටත් දුලිනිලගෙ දුර නෑයෙක්ලු. දුලිනියි එයාගෙ අක්කයි අතරෙත් වසර දහයක පමණ වයස් පරතරයක් තිබෙනවා. නාත් දුලිනිව සැලකුවෙ තමන්ගෙම දරුවෙක් ගානටලු. නාත් සේවය කරපු සුප්‍රසිද්ධ සමාගමේ නීති නිලධාරියා ලෙස වැඩ බැලුවෙ අපේ අයියගෙ බිරිඳගෙ මල්ලි. මට වැඩිය සෑහෙන වැඩිමල් වුණත් තනුරා අක්කා මගේ නෑනා මාව බොහොම හොඳින් තේරුම් අරං හිටියා. තනුරා අක්කා එයාගෙ මල්ලිගෙන් අහලා මට දුලිනිලගෙ ගෙවල් තියෙන තැනත් හොයලා දුන්නා.

මට දැන් මතක් වෙද්දිත් හිනා යනවා, දුලිනිගෙ ලිපිනය මට හොයලා දුන්න දවසෙ මං අපේ තනුරා අක්කාව වඩා ගෙන වටයක් කැරකුණා. දුලිනි බැන්ඳ කියලා දැනගත්ත දවසෙ තනුර-ක්කා මං වෙනුවෙන් ගොඩක් ඇඬුවා. එතකොට අපේ මණික්, ඒ කිව්වෙ අපේ අයියගෙයි තනුර-ක්කා ගෙයි එකම පුතා අටේ පන්තියෙ විතර ඉගෙන ගත්තෙ. මණිකුයි මායි අතරෙ වෙනසක් එයා දැක්කෙ නැහැ. තනුරා අක්කා අපේ අයියව බැන්දෙ යෝජනාවකින්. එයා අපේ පවුලට බැඳෙද්දි මං ඉස්කෝලෙ යන පොඩි කොල්ලෙක්. මටයි ආර්තීටයි දෙවෙනි අම්මා වුණේ අපේ තනුරා අක්කා. අපේ සිතුම් පැතුම් එදා ඉඳන් එයා තේරුම් ගත්තා. අපේ අයියාට දෙයක් කියන්න ඕනෙ වුණාම මං වගේම ආර්තීත් තනුර-ක්කා එක්ක ගිහින් තමා අයියට කථා කරන්නෙ. එතකොට එයා අපි වෙනුවෙන් අයියට ඇප වෙනවා.

"ඔන්න දැන් මට තමා අයියගෙනුයි අප්පච්චිගෙනුයි බැනුම් අහන්න වෙන්නෙ කියපු වෙලාවට දෙන්න ගෙදරට නාවොත්"

අළුත් චිත්‍රපටියක් තිරගත වුණාම ඒක බලන්න යන්න අයියගෙන් අපිට අවසර අරන් දීලා තනුර-ක්කා හැමදාම අපි දෙන්නට ඔය අවවාදෙ තදින්ම දෙනවා. ඒත් චිත්‍රපටිය බලලා නුවර ඇවිදලා යාළුවොත් එක්ක ටිකක් විනෝද වෙලා අපි ආපහු ගෙදර යන්නෙ මල්වත්තත් බලලා. හැමදාම බැලුවත් අපිට මල්වත්තයි මාලිගාවයි එපාවෙන්නෙ නැහැ. මං මාලිගාව ඉස්සරහින් ඉස්කෝලෙ ගිය කොල්ලෙක් කියලා අපේ කනිෂ්ඨ මල්ලි කෙනෙක් විශ්ව විද්‍යාලයට ආපු දවසෙ කිව්වෙ පුදුම ආඩම්බරේකින්. මාලිගාවයි මල්වත්තයි ඒ තරමට අපේ ජීවිත වලට බද්දයි. ඉතින් නුවර පුරාම රස්තියාදු වෙලා කළුවර වැ-ටෙන්න ලංවෙලා අපි ගෙදර යද්දි තනුරක්කා ඉන්නවා අපේ මහ සාලෙ කවිච්චියෙ වාඩිවෙලා.

"අද දෙන්නටම බත් නැහැ. මට ආපහු කියන්න එපා ගෙදරින් පික්චර් බලන්න යන්න අවසර අරන් දෙන්න කියලා"

මං ඉතින් තනුරක්ක ගාවින් වාඩිවෙලා මුළු චිත්‍රපටියම එයාට කියනවා.

"ෂා මාර ලස්සන කථාවක්නෙ පොඩ්ඩො. මටත් අසයි බලන්න යන්න."
එතකොට තමා ආර්තී කට අරින්නෙ.

"අක්ක යන්න අයියත් එක්ක. මං මණික් ව බලාගන්නං. ඉස්කෝලෙ වැඩ ටිකත් මං කර-වන්නං"
ඊලඟ දවසෙ හවස තනුරක්කයි අපේ අයියයි හයයි තිහේ දර්ශනය බලන්න යද්දි තනුර-ක්කගෙ මූණෙ මල් පිපිලා. ලස්සන ඔසරියක් ඇඳලා අපේ අම්මා එයාට නිතරම තෑගි දෙන ගෙඩි මාලෙකුත් පැලඳලා මොණරි වගේ එයා යන හැටි මට මතක් වෙද්දි එයා ගැන හිතේ තියෙන අනුපමේය සෙනෙහස තවත් වැඩි වෙනවා.

අපේ තනුරක්කා නියම උඩරට මැණිකෙ කෙනෙක් විදියට තමා අඳින්නෙ කොහේ ගියත්.මං ඕස්ට්‍රේලියාවට එද්දි මණි ක්ටයි මටයි ගමකට කැවිලි ජාති හදලා මගේ පොත්පත් ඇඳුම් සේරම ගමන්මලු වලට අසුරලා මං එන්න ලෑස්ති වෙලා වඳින්න එයාව හොයනකොට අපේ මහ ගෙදර මැද මිදුල කෙළවර තියෙන පරණ ලී බංකුවෙ වාඩිවෙලා මූණ ඉදිච්ච දෙළුං ගෙඩියක් ගානට රතු කරං ඇඬුවෙත් මගේ තනුරක්කම තමා. මගේ ජීවිතේ වටේ ඉඳන් මට ආදරය නොඅඩුව දුන්න මට සමීපම කාන්තාවො ගැන දවසක ලංකාවෙ ටැබ්ලොයිඩ් එකක් ප්‍රශ්න ටිකක් ඇහුවොත් අපේ අම්මයි , ආර්තීයි , තනුරක්කයි ගැන මුලින්ම කියන්න කියලා නිල්හාන් මට විහිළුවට කිව්වත් ඒක තමා සැබෑව. තාම හැබැයි වාසනාවකට වගේ මගෙන් පත්තරයක් ඒ ගැන ඇහුවෙ නැහැ. නළු නිළියන්ගෙන් වගේම චිත්‍රපටි අධ්‍යක්ෂකවරුන්ගෙනුත් බොළඳ ප්‍රශ්න ඇසීමේ නව ප්‍රවණතාවක් රටේ දැන් ඇතිවේගෙන එනවා. ඒක එක අතකට හොඳයි. එතකොට චිත්‍රපටි නිර්මාණය කරන්නන් සහ සාමාන්‍ය ජනතාව අතර තියෙන පරතරය අඩුවෙනවා කියලයි ආර්තී කියන්නෙ.
තනුරක්කා ගෙ මල්ලි ,දුලිනිගෙ මස්සිනා නාත් වීරමන් හරහා මට දුලිනිගෙ ලිපිනය හොයලා දුන්නු කාලෙ පතිරාජ ගෙ හොඳම චිත්‍රපටියක් රීගල් එකට ඇවිත් තිබුණා. අපි කට්ටිය චිත්‍රපටිය බලලා ගල්කිස්ස මුහුදුවෙරළට යන්න හිතන් පානදුර බස් එකකට රීගල් එක ලඟින් ගොඩවුණා. බස්රිය ඇතුලෙ පහසුවෙන් අසුන්ගන්න තරමට ආසන තිබුණා.

පුංචි වැහි පොදයක් වැටෙමින් තිබුණ නිසා හැමෝම වගේ ජනේල වීදුරුව වහන්න උත්සුක වුණේ ඒ වෙද්දි ගාලුමුවදොර පසු කරමින් සිටි නිසා. මුහුදු හුලඟත් එක්ක වැහිබිංදු ඇතුලට එන නිසා මං සමීපයේ ජනේලය අසල අසුන්ගෙන සිටි යුවතිය වීදුරුව වහන්න උත්සාහ කරන බ වමට පෙනුණා. මං යුවතිය දිහා නිකමට බැලුවා. දෙයියනේ දුලිනි. එයාගෙ නිල්පාට පුංචි මල් ඉහිරුණු කමිසය පුරාම වැහි බිංදු.

"තද වෙලා නේද"

මං නිකටෙන් ජනේලය පෙන්වලා තරමක් ඉස්සිලා ජනෙල් වීදුරුව ඇදලා ඒක වැහුවා.මං අහපු ප්‍රශ්නෙට හීන් හිනාවක් යන්න ආවත් ඇය ඒක වැරෙන් වලක්වගෙන හිටියා.හීනියට පොඩියට හිටියට ආඩම්බරකම කියලා මට එවෙලෙ හිතුණා. මගේ කකුලෙ වදියි කියන බයට පුළුවන් තරමක් ජනේලෙ පැත්තට තෙරපිලා හිටිය දුලිනිව සාරංග දැක්කා.

"මචං උඹ ඔතනින් නැගිටපං. නැත්තන් ඔය නංගි බස් එක හිල් කරයි"

කට්ටියම උස් හඬින් හිනා වුණාම දුලිනි හිටියෙ අඬන්න වගේ. හොඳ වෙලාවට එයා බහින තැන ලංවුණා. මං හිටගත්තා එයාට ඉඩ දීලා. බස් හෝල්ට් එකේ එයාගෙ අම්මයි තාත්තයි හිටියා එයාව ගන්න ඇවිත්. සමහර විට ඒගොල්ලො නැදෑ ගෙදරක එන්න ඇති. දුලිනිට කියන්න ඇති දේශණ අවසන් වෙලා බස්එකේ ඇවිත් දෙහිවල හංදියෙන් බහින්න කියලා.

"මචං අර අච්චර සෙට් එකක් ඇවිල්ල ඉන්නෙ අර තනි කෙල්ලව එක්කන් යන්නද? මාරයිනෙ බං.ෂහ්. කෙල්ලක් වෙලා ඉපදෙන එකෙත් හෙන ආතල් එකක් තියෙනවා නේද බං"

සාරංග ඔහේ කියවනවා. මං දුලිනි ගැන කල්පනා කර කර හිටිය මිසක් සාරංගට පිළිතුරු දෙන්න උනන්දු වුණේ නැහැ.

**මතු සම්බන්ධයි**

